සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

**ඉතිහාසය II (II කොටස)**
வரலாறு II (பகுதி II)
History II (Part II)

**25-B S II**

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න**. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) කෝර්සිකා (ii) පිරනීස් (iii) රයින් ගඟ
(iv) කළු මුහුද (v) ලන්ඩන් (vi) බර්ලින්
(vii) ශාන්ත පීටර්ස්බර්ග් (viii) ස්විට්සර්ලන්තය

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගින්)*

**2.** ග්‍රීක සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. *(ලකුණු 14යි)*

**3.** "පුනරුදය යුරෝපා ශිෂ්ටාචාරයේ වර්ධනයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි."
(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. *(ලකුණු 01යි)*
(ii) පුනරුදයට අනුග්‍රහය දැක්වූ **දෙදෙනෙකු** නම් කරන්න. *(ලකුණු 02යි)*
(iii) පුනරුදය ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන සාධක සැකෙවින් දක්වන්න. *(ලකුණු 04යි)*
(iv) කලාව හා දේශපාලන දර්ශනය යන ක්ෂේත්‍රවල ඇති වූ ප්‍රබෝධය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පුනරුදය යුරෝපා ශිෂ්ටාචාරයේ වර්ධනයේ සන්ධිස්ථානයක් සලකුණු කරන්නේ කෙසේ දැයි පරීක්ෂා කරන්න. *(ලකුණු 07යි)*

**4.** (i) පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ ජාතික රාජ්‍ය නැඟී ඒමට තුඩුදුන් සාධක කවරේ ද? *(ලකුණු 06යි)*
(ii) ජාතික රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. *(ලකුණු 08යි)*

**5.** (i) අමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න. *(ලකුණු 06යි)*
(ii) අමෙරිකානු නිදහස් සටනෙන් උද්ගත වූ ප්‍රධාන ප්‍රතිඵල පරීක්ෂා කරන්න. *(ලකුණු 08යි)*

**6.** (i) 1815 සිට 1848 දක්වා ජර්මනිය එක්සේසත් කිරීමට එරෙහිව පැවති ප්‍රධාන බාධක ගෙනහැර දක්වන්න. *(ලකුණු 06යි)*
(ii) 1862 සිට 1871 දක්වා ජර්මනිය එක්සේසත් කිරීම සඳහා බිස්මාක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය විවේචනාත්මකව විමසන්න. *(ලකුණු 08යි)*

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත

7. "යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ප්‍රධානතම හේතුව විය."

(i) පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ආසන්නතම සිද්ධිය කුමක් ද? (ලකුණු 01යි)

(ii) එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකට අයත් වූ රටවල් **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 02යි)

(iii) යුරෝපය බල කඳවුරු දෙකකට බෙදී ගිය අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇති වීමට කෙතෙක් දුරට හේතු වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07යි)

8. රුසියාවේ බලය අත්පත් කරගැනීමෙන් පසු බොල්ෂෙවික්වරුන් විසින් 1924 දක්වා ඇති කරන ලද ප්‍රතිසංස්කරණ පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

9. **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණු සැකෙවින් දක්වන්න. (ලකුණු 05යි)

(ii) එම සංවිධානය එකී අරමුණු සාර්ථක කර ගැනීමට කෙතෙක්දුරට සමත් වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09යි)

**(B)** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) අධිරාජ්‍යයේ ආරම්භය තෙක් රෝමයේ ඇති වූ ආණ්ඩුක්‍රම වෙනස්වීම්

(ii) වැඩවසම් ක්‍රමයේ පිරිහීම

(iii) පෘතුගීසීන් නිරත වූ දේශ ගවේෂණ

(iv) 1688 ඉංග්‍රීසි විප්ලවය

(v) යුරෝපා සම්මේලන ක්‍රමය

(vi) අන්තර් යුද්ධ සමයේ ආඥාදායක පාලන ක්‍රම

*(එක් කෙටි සටහනකට ලකුණු 07 බැගිනි)*

* * *

www.artsapi.lk

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත